NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 09 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 06 ඒකකය |
|---|---|---|

### රජ ගෙදරින් මෙහෙණවරට.

- සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බුද්ධ මාතා යන ගෞරව නාමයෙන් හැඳින්වෙන්නේ,
   (1). මහා ප්‍රජාපතී ගෝතමියයි (3). මහමායා දේවියයි
   (2). යසෝදරා දේවියයි (4). භද්දකච්චානා දේවියයි

02. රාහුල මාතාව නමින් හඳුන්වන්නේ,
   (1). යසෝදරා දේවියයි (3). සුජාතා දේවියයි
   (2). කිසාගෝතමියයි (4). ජනපද කල්‍යාණී දේවියයි

03. මහා ප්‍රජාපතී ගෝතමියගේ දෙමාපියන් වන්නේ,
   (1). අංජන රජු සහ යසෝදරා දේවියයි
   (2). කොසොල් රජු සහ කෝසල මල්ලිකා දේවියයි
   (3). අංජන රජු සහ මහාමායා දේවියයි
   (4). සුප්‍රබුද්ධ රජු සහ අමිතා දේවියයි

04. බුදුරජාණන් වහන්සේට සිවුරක් පූජා කිරීමට සූදානම් වූ විට එය සඟ සතු කොට පූජා කරන ලෙස මඟ පෙන්වූයේ කවුරුන් හටද?
   (1). භද්දකච්චානා තෙරණියටයි (3). කිසාගෝතමී තෙරණියටයි
   (2). මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියටයි (4). සංඝමිත්තා තෙරණියටයි

05. ප්‍රජාපතී ගෝතමී ඇතුළු පන්සියයක් කුමාරිකාවන් හිස මුඩු කොට කසාවත් හැඳ පා ගමනින් යොදුන් 150ක් දුර ගෙවා පැමිණියේ,
   (1). විශාලා මහනුවර කූටාගාර ශාලාවටය (3). කිඹුල්වත්පුර නිග්‍රෝධාරාමයටය
   (2). සැවැත්නුවර ජේතවනාරාමයටය (4). සැවැත්නුවර පූර්වාරාමයටය

06. ''යම් ස්ත්‍රියක් පැවිදිව වීර්ය වඩයි නම් ඇයට ඇයගේ ස්ත්‍රීභාවය නිවනට බාධාවක් නොවේ.'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළේ,
   (1). ප්‍රජාපතී ගෝතමිය අරඹයා ය (3).
   (2). ආනන්ද හාමුදුරුවෝ අරඹයා ය (4).

07. මහා ප්‍රජාපතී තෙරණින් වහන්සේ දූරු අගතනතුර කුමක්ද?
   (1). අභිඥාලාභීන් අතර අගතනතුර (3). විචිත්‍ර ධර්මකථිකාවන් අතර අගතනතුර
   (2). විනයධර භික්ෂුණීන් අතර අගතනතුර (4). චිරරාත්‍රඥ භික්ෂුණීන් අතර අගතනතුර

Agaram.l - Keep your dreams alive!



agaram.lk

08. භද්දකච්චානා තෙරණිය දූරු අගතනතුර කුමක්ද?

(1). ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර අගතනතුර
(2). බහුශ්‍රැත භික්ෂුණීන් අතර අගතනතුර
(3). ඍධිමත් භික්ෂුණීන් අතර අගතනතුර
(4). අභිඥාලාභී භික්ෂුණීන් අතර අගතනතුර

09. භද්දකච්චානා දේවියගේ චරිතය ඇසුරු කරගෙන රචිත කාව්‍ය ග්‍රන්ථයක් වන්නේ,

(1). යසෝදරා වත (2). සඳකිඳුරුදා කව (3). කුස ජාතක කව (4). කාව්‍යශේඛරය

10. භද්දකච්චානා දේවියගේ පතිභක්තිය ගෞරවයට ලක් කරමින් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා නරක ලද ජාතක කතාව වන්නේ,

(1). මහා ධර්මපාල ජාතකය
(2). අම්බ ජාතකය
(3). නලපාන ජාතකය
(4). චන්ද කින්නර ජාතකය

## II කොටස

- **සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. (1). භික්ෂුණී සාසනය ආරම්භ කිරීමට මූලිකත්වය ගත් කාන්තාව කවුරුන්ද?
(2). භික්ෂුණී සාසනය ආරම්භ කිරීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
(3). අෂ්ට ගරු ධර්ම ලියා දක්වන්න.

02. (1). බුද්ධ මාතාවගේ ධාතු තැන්පත් කොට ස්තූපයක් ගොඩනගන්න පෙළඹුණු රජදරුවෝ කවුරුන්ද?
(2). බුද්ධ මාතාවගේ පිරිනිවන්පෑම පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
(3). ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ ලියන්න.

03. (1). භද්දකච්චානා දේවිය හඳුන්වන වෙනත් නම් කරන්න.
(2). ''කැලේ තිබෙන කොයි දේවත් රස වේවා'' යන කවිය සම්පූර්ණ කරන්න.
(3). භද්දකච්චානා දේවියගේ පතිභක්තියේ උදාරත්වය පිළිබඳ විස්තර කරන්න.

04. (1). යසෝදරා දේවිය ප්‍රජාපතී තෙරණියගෙන් පැවිද්ද ලබා ගැනීමට ගියේ කා සමගින්ද?
(2). සඳකිඳුරු ජාතකයේ කතාව කෙටියෙන් ලියන්න.
(3). රාහුල කුමරුගේ පැවිදිවීම පිළිබඳ විස්තරය කෙටියෙන් ලියන්න.

05. (1). අභිඥාලාභය යනු කුමක්ද?
(2). චිරරාත්‍රඥලාභී යනු කුමක්ද?
(3). ප්‍රජාපතී තෙරණිය බුදු පාමුල ගුණවර්ණනා කළේ කෙසේද?

Agaram.l - Keep your dreams alive!
Agaram.l - Keep your dreams alive!
agaram.lk